# සිංහල භාෂාව සහ සාහිත්‍යය

## 7 ශ්‍රේණිය

## පළමු වාර අවසන් පරීක්ෂණය

කාලය පැය 2 කි

---

නම:---------------------------------------

<u>පළමු කොටස</u>

- සියලුම ප්‍රශ්න සඳහා ඉදිරියෙන් දී ඇති වරහන් තුළ නිවැරදි පිළිතුරෙහි අංකය සඳහන් කරන්න.

**1)** නිවැරදි ව්‍යාකරණය අනුව ලියා ඇති වැකිය කුමක්ද?

I. අම්මා උදෑසනම පන්සලට යති.
II. නංගී මිදුලේ සෙල්ලම් කරති.
III. කුරුල්ලෝ අහසේ පියාඹති.
IV. ගොවියන් කුඹුරට යති. (-----)

**2)** වත්මන් ලේඛන ව්‍යවහාරයේ භාවිත නොවන සඤ්ඤක අක්ෂරය යටින් ඉරක් අඳින්න.
I. ඟ
II. ජ
III. ඬ
IV. ඹ (-----)

**3)** නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කීයද?
I. 54
II. 60
III. 59
IV. 58 (-----)

**4)** පහත සඳහන් උක්ත පදවලට අදාළ අනුක්ත පද ඉදිරියෙන් ලියන්න.
ඔහු --------------------
ළමයෙක් --------------------

**5)** පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.
**1.** අනුන්ගේ පානෙන් ---------------- බලනවා වගෙයි.
I. එළිය
II. අංජනන්
III. කළුවර
IV. හොඳ (-----)

**2.** පුහුල් හොරා ---------------- දැනෙයි.
I. හිසෙන්
II. කරෙන්
III. ඇඟෙන්
IV. සිතින් (-----)

6) පහත ඉඟිවැකි මඟින් හඟවන අර්ථය තෝරන්න.

1. කුකුළා අතින් අරන්
   - I. උදෑසන
   - II. රාත්‍රියේ
   - III. සනධ්‍යාවේ
   - IV. දහවලේ (-----)

2. කරල පැහුණා
   - I. තේරුම් ගියා
   - II. වාසියක් සිදු වුණා
   - III. වයසට යාම
   - IV. ගොයම් ඵලදාව වැඩි වීම (-----)

7) මධ්‍යම පුරුෂ ඒකවචන පදය තෝරන්න.
   - I. තොප
   - II. ඔහු
   - III. ළමයා
   - IV. මම (-----)

8) අතීත කාල ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා පදය තෝරන්න.
   - I. කළහ
   - II. කළෙමි
   - III. කරයි
   - IV. කළෙහි (-----)

9) මුලින් දී ඇති පදයට සමාන පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   - I. මොනරා - මයුර, සිකි, නිල්ගෙල
   - II. ශෝකය - සොම්නස, කනගාටුව, දුක
   - III. ප්‍රගතිය - දියුණුව, අවනතිය, වර්ධනය (-----)

10) පහත පද සඳහා විරුද්ධ ඉදිරිනේ සී ඇති හිස්තැනෙහි ලියන්න.
   - I. අභ්‍යන්තර -------------------
   - II. සරල -------------------

11) නිවැරදි අක්ෂර වින්‍යාසය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   - I. ග්‍රන්ත, සණ්ටාර, නිශ්වල
   - II. විස්මය, විමර්ශන, මිශ්‍රණ
   - III. වැටිනි, ඇඟිලි, පිළිබඳ
   - IV. පිලිවෙළ, කකුල, ළපටි (-----)

12) පහත වචන සඳහා අරුත් ඉදිරියෙන් දී ඇති හිස්තැනෙහි ලියන්න.
   - I. උප්පිඩ -----------------
   - II. මුත්තෙට්ටුව -----------------

13) මිශ්‍ර ක්‍රියා පදය තෝරන්න.
   - I. නෙළා
   - II. නෙළ නෙළා
   - III. නෙළුවේය
   - IV. නෙළද්දී (-----)

14) පහත වාක්‍යවල හිස්තැනට ගැළපෙන උක්ත පදය තෝරන්න.

1. ---------------- පාරේ වැඩ කරති.

I. කම්කරුවා
II. කම්කරුවන්
III. කම්කරුවෝ
IV. කම්කරුවෙක් (-----)

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.

15) අපි හොඳින් විභාගයට මුහුණ -----------

I. දෙමු
II. දුන්හ
III. දුන්නෝය
IV. දුන්නේය (-----)

16) පැය දෙකකින් ඔවුහු දිවයිනේ අනික් පැත්තට --------------

I. පැමිණියෝය
II. පැමිණියේය
III. පැමිණියාය
IV. පැමිණියෙහිය (-----)

හිස්තැනට ගැළපෙන නිවැරදි වචනය හෝ අකුර වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

17) නංගීගේ------------- ( වනයට/ වණයට) බෙහෙත් දැමීමෙන් පසුව එය සුව විය.

18) -----හ (ෂ/ශ/ස) ගණ දානයට වඩිති.

19) පහත ඒකවචන නාමපද බහුවචන නාමපද බවට හරවා හිස්තැනෙහි ලියන්න.

I. චාරිත්‍රය -------------------
II. පුතා -------------------

20) පහත පුරුෂවාචී පදවලට අයත් ස්ත්‍රීවාචී පද හිස්තැනෙහි ලියන්න.

I. මැති ----------------------
II. සොර ----------------------

(ලකුණු 2*20=40)

## දෙවන කොටස

1) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 125 කට නොඅඩු රචනාවක් ලියන්න.

I. අධ්‍යාපනයේ වටිනාකම
II. පරිසරය සුරකිමු
III. වැඩිහිටියන්ට සලකමු
IV. ජලය අපගේ ජීවය යි

(ලකුණු 15)

2) පෙළපොතේ ඇතුළත් පහත සඳහන් පාඨය මතකයට නගා ගනිමින් පිළිතුරු සපයන්න.

"පුතේ, අම්මාගෙන් යතුර ඉල්ලාගෙන එන්න."

I. පහත ප්‍රකාශය කළේ කවුද?
II. එම ප්‍රකාශය කරන ලද්දේ කාටද?
III. එම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවේද?
IV. එම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?
V. මෙහි සඳහන් විධි ක්‍රියා පදයක් ලියා දක්වන්න. (ලකුණු 15)

3) නූතන සිංහල අක්ෂර මාලාව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

I. නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කොපමණ ද?
II. අක්ෂර වර්ග කෙරෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.
III. වත්මන් ලේඛන ව්‍යවහාරයේ දක්නට නොමැති සඤ්ඤකඅක්ෂරය කුමක්ද?
IV. පහත අල්පප්‍රාණ අක්ෂරවලට අදාළ මහාප්‍රාණ අක්ෂර ලියන්න.

ජ -----------------
ප -----------------
ඩ -----------------

V. නූතන සිංහල අක්ෂර මාලාවේ දක්නට ලැබෙන පහත අක්ෂර ඇතුළත් කරමින් වචන නිර්මාණය කරන්න.

ඟ ----------------
ඬ -----------------
ඳ ------------------

(ලකුණු 15)

4) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

සූරියගොඩ හිමියන් යටතේ සිය දැනුම දියුණු කර ගැනීමට කටයුතු කළ සරණංකර සාමණේරයන් වහන්සේ එපමණකින් සෑහීමකට පත් නොවූහ. විවිධ කාරණා නිසා මේ කාලය වනවිට ලංකාවේ භාෂා, සාහිත්‍ය ක්ෂේත්‍රයන්හි පරිහානි තත්වයක් උද්ගතවී තිබුණි. එබැවින් උන් වහන්සේට පාලි භාෂාව ඉගෙනීම සඳහා එවකට සිරගතව සිටි ලෙව්කේ රාළ වෙත යෑම සිදු විය. පසු කලෙක පල්කුඹුරේ අත්ථදස්සී හිමියන්ගේ ඇසුරෙහි බාලාවතාරය සම්පූර්ණයෙන්ම උගත් උන් වහන්සේ ඉගෙනීමට දැක් වූ උනන්දුව පිළිබඳ කියැවෙන ජනප්‍රවාද රැසකි. උන්වහන්සේ සැතපෙන විට හිසට පොල් කටුවක් තබා ගත් බව එබඳු එක් කතාවකි. එයින් හිසට ඇති වන වේදනාව නිසා එක දිගට සැතපීමට නොහැකිව අවදි වූ සෑම අවස්ථාවකම පාඩම් කිරීමට කටයුතු කළ බව කියැවේ.

I. සරණංකර හිමි පාලි භාෂාව උගත්තේ කාගෙන් ද?
II. උන්වහන්සේ ඉගෙනීමට දැක්වූ උනන්දුව පිළිබඳ කියැවෙන ජනප්‍රවාදයක් සඳහන් කරන්න.
III. ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ අතීත කාල බහුවචන ආඛ්‍යාතයක් සඳහන් කරන්න.
IV. 'සැතපෙනවා' යන ක්‍රියාපදයේ අර්ථය සඳහන් කරන්න.
V. 'දැනුම' යන්නට ඔබ දන්නා සමාන පදයක් ලියන්න.

(ලකුණු 15)

ර/බල/ගල්පාය විද්‍යාලය